කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිව්වන වසර පරීක්ෂණය

පළමුවන සෙමෙස්තරය - 2018/2019

# SLG 4197 – ශාස්ත්‍රීය ලේඛන මූලධර්ම

(පැ දෙකයි)

යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

## 1 කොටස

1. " පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීම පර්යේෂණ ක්‍රියාවලියේ ආරම්භක පියවර යි" ඔබගේ යෝජිත අධ්‍යයනයේ පර්යේෂණ මාතෘකාව ඇසුරින් විමසන්න.

2. ' පර්යේෂණ ගැටලුව' (Research Problem) යනු කුමක්දැයි ඔබගේ පර්යේෂණය ඇසුරින් සාකච්ඡා කරන්න.

3. සමාජීය විද්‍යා හෝ මානව ශාස්ත්‍ර පර්යේෂණයක දී භාවිතයට ගනු ලබන දත්ත රැස් කිරීමේ විධික්‍රම කවරේදැයි ඔබගේ යෝජිත අධ්‍යයනය ඇසුරින් පහදන්න.

4. " සාහිත්‍ය විමර්ශනයක ( Literature Review) කාර්යභාරය වන්නේ අදාළ පර්යේෂණ සාහිත්‍යය විභාග කොට විචාරාත්මක ඇගයීමකට ලක් කිරීම යි" ඔබගේ යෝජිත අධ්‍යයනය ඇසුරින් විමසන්න.

## 2 කොටස

5. ශාස්ත්‍රීය ලේඛනයක් සම්පාදනයේ දී සැලකිල්ලට ගත යුතු මූලික කරුණු කවරේදැයි පැහැදිලි කරන්න.

6. "පරිච්ඡේද සංවිධානය නිබන්ධ රචනයේ දී අවධානය යොමු කළ යුතු අංශයකි". ඔබගේ යෝජිත අධ්‍යයනයේ දළ පරිච්ඡේද සැලැස්මක් ඇසුරින් මේ අදහස සාකච්ඡා කරන්න.

7. ශාස්ත්‍රීය ලේඛනයක දැකිය හැකි උද්ධෘත වර්ග කවරේදැයි සනිදර්ශනව දක්වන්න..

8. අධෝ ලිපි හෙවත් පිටු අග සටහන් ක්‍රමය ( Footnotes ) සහ කර්තෘ - වර්ෂ ක්‍රමය (Author – Date) අනුව මූලාශ්‍රය සටහන් කරන ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

***